# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2097/15 - 2018 නොවැම්බර් මස 14 වැනි බදාදා - 2018.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### මුදල් නීති පනත

මුදල් නීති පනතේ (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වැනි අධිකාරය) 10 (ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන රෙගුලාසීන් ය.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි,
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2018 නොවැම්බර් මස 14 වැනි දින.

''ඇ'' රෙගුලාසිය

**සංචිත අවශ්‍යතා**

මුදල් මණ්ඩලය විසින් පනවන ලද හා 2013 අප්‍රේල් මස 12 වැනි දින අංක 1805/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලදුව, 2013 ජුනි මස 26 වැනි දින අංක 1816/13, 2015 දෙසැම්බර් මස 31 වැනි දින අංක 1947/39, 2018 සැප්තැම්බර් මස 19 දින අංක 2089/28, 2018 ඔක්තෝබර් මස 01 වැනි දින අංක 2091/2 සහ 2018 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 2092/62 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයන්* හි පළ කරන ලද දැන්වීම් මගින් තවදුරටත් සංශෝධනය කරන ලද 'ඇ' රෙගුලාසිය 2018 නොවැම්බර් මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, පහත සඳහන් ආකාරයට මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

අංක 2 (i) රෙගුලාසියෙහි ''සියයට 7.5 කට'' යන වචනය හා ඉලක්කම ඉවත් කර ඒ වෙනුවට ''සියයට 6.0 කට'' යන වචනය හා ඉලක්කම ආදේශ කිරීමෙන්.

''අ'' උපලේඛනය පහත දැක්වෙන රෙගුලාසි සහිත ''අ'' උපලේඛනය ලෙස ප්‍රතිෂ්ඨාපනය වේ.


1A - G 28965 — 27 (2018/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*'අ' උපලේඛනය*

*වාර්තා කිරීමේ ආකෘතිය*

**දෛනික තැන්පතු වගකීම් සාමාන්‍ය පිළිබඳ වාර්තාව**

බැංකුවේ නම : ..........................................................................................................

කාල වකවානුව : .......................................... සිට ............................................... දක්වා
(දිනය) (දිනය)

වෙත : අධ්‍යක්ෂ
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ 01.

ඉහත දක්වා ඇති කාල පරාසයේ එක් එක් දිනයට අදාළ දෛනික ව්‍යාපාර කටයුතු අවසානයේ දී, බැංකුවේ පොත්වල සඳහන් තැන්පතු ශේෂය පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට තැන්පතු වගකීම් හි සාමාන්‍ය වාර්තා කළ යුතු ය.

| (i) | (ii) | (iii) | (iv) |
|---|---|---|---|
| *ඉල්ලුම් තැන්පතු* | *කාලීන හා ඉතුරුම් තැන්පතු* | *ණයවර ලිපි/ප්‍රතිගාහණ මත ලියවිලි සඳහා ආන්තික අවශ්‍යතාව* | *අනෙකුත් සියළුම තැන්පතු වගකීම්* [1] |
| | | | |

1. තැන්පතු සහතික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල විය යුත්තේ ප්‍රකාශ කළ වටිනාකමයි.

**සංචිත අවශ්‍යතා**

අදාළ සංචිත කාල පරිච්ඡේදය : ..................................................................................................

| අයිතමය | අගය ශ්‍රී ලංකා රුපියල් වලින් |
|---|---|
| 1. ණයවර ලිපි සඳහා වන සියයට 100ක සාමාන්‍ය දෛනික සමස්ත ආන්තික අවශ්‍යතාව පහත දක්වා ඇති ණයවර ලිපි සඳහා අවස්ථානෝචිතව සුදුසු පරිදි :<br>(අ) (i) 2018 සැප්තැම්බර් මස 19 වැනි දින අංක 35/01/005/0010/20 දරන "මෝටර් රථ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි " චක්‍රලේඛය මඟින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව හෝ<br>(ii) 2018 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 35/01/005/0010/21 දරන "මෝටර් රථ හා අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි " චක්‍රලේඛය මඟින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව<br>(ආ) 2018 ඔක්තෝබර් මස 11 දින චක්‍ර ලේඛ අංක 2 දරන ප්‍රතිග්‍රහණ මත ලියකියවිලි ලබාදීමේ කොන්දේසි අනුව සිදු කරන ආයතන සඳහා වන ආන්තික අවශ්‍ය තාව. | |
| 2. ඉහත අංක 1 හැර දෛනික රුපියල් තැන්පතු වගකීම්වල මුළු එකතුවේ සාමාන්‍ය අගයෙන් සියයට 6.0 ක් | |
| 3. ඉහත (1) සහ (2) මගින් ආවරණය වන තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන්, සියයට 2 ට වඩා වැඩියෙන් නමුත් සියයට 4 නොඉක්මවා තබාගෙන ඇති ශ්‍රී ලංකා රුපියල් කාසි හා නෝට්ටුවල සාමාන්‍යය. | |
| 4. සංචිත නඩත්තු කාලය තුළ පවත්වා ගෙන යා යුතු මුළු සංචිත අවශ්‍යතාවය (1 + 2 - 3) | |

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි සහ මෙම බැංකුවේ පොත්වලට අනුකූල බවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති නියෝගවලට අනුකූල බවද අපි/මම සහතික කරමු / කරමි.

...................................... ........................................

දිනය රාජකාරි අත්සන

සටහන -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැර වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන තැන්පතු සහ ස්ථාන ගත කිරීම්, නියම කර ඇති අනුපාත වලට අනුව සංචිත අනුපාත පවත්වා ගෙන යාම සඳහා ගිණුම් ගත කළ යුතු ය.

(ආ) සියලු අගයන් ආසන්න රුපියලට දැක්විය යුතු ය.

11 - 1297

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.